සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணைமதிப்பீடு - 2016
**Second Term Evaluation - 2016**

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | බුද්ධ ධර්මය I පත්‍රය<br>புத்த சமயம் வினாத்தாள்-I<br>Buddhism I Paper | පැය එකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>One Hour |

**සැලකිය යුතුයි:**

I. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.

II. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ගන්න.

01. බුද්ධත්වයට පත්වීම සඳහා දසමාර සේනා පරාජය කිරීමට සිදුහත් බෝසතාණන් වහන්සේට සිදුවිය. බුද්ධත්වයෙන් පසු උන්වහන්සේ වසඟයට ගැනීමට පැමිණි මාර දූවරුන් ගණන වූයේ,
1. 2කි 2. 3කි 3. 4කි 4. 1කි

02. නින්දා අපහාසවලට මුහුණ දීම ප්‍රසංශා ලැබූ විට උද්දාම නොවීම, සැපේදී දුකේදී නොසැලී සිටීම බුදු දහමේ හැඳින්වෙන්නේ,
1. තාදී ගුණය ලෙසය 2. අවිහිංසා ගුණය ලෙසය
3. කරුණා ගුණය ලෙසය 4. මෛත්‍රී ගුණය ලෙසය

03. පටිච්ච සමුප්පාද ධර්මයට අනුව තෘෂ්ණාව නිසා ඇතිවන්නේ,
1. වේදනාවයි 2. උපාදානයයි 3. නාමරූපයි 4. සංඛාරයි.

04. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා කම්මන්ත අයත් වන්නේ,
1. සීලයට ය 2. සමාධියට ය 3. ප්‍රඥාවට ය 4. කර්මයට ය

05. දාන පාරමිතාව තුළින් අපට ලබාගත හැකි ආදර්ශයක් වන්නේ,
1. අනුකම්පාව ඇතිකර ගැනීමයි 2. කරුණාවෙන් යුක්ත වීමයි
3. ලෝභ දෝස මෝහ දුරුකිරීමයි 4. අසරණයන්ට මෛත්‍රී කිරීමයි

06. සිත දූෂ්‍ය කරන කෙලෙස් සතුරන් පස් දෙනෙක් ගැන බුදු දහමේ ඉගැන්වේ. එයින් ථීනමිද්ධ යනු,
1. පරලොව පිළිබඳ සැකයයි 2. කම්සැප විඳීමේ ආශාවයි
3. සිත කය දෙකෙහි උදාසීනකමයි 4. සිතෙහි නොසන්සුන්කමයි

07. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිට වූයේ,
1. ඕල්කට්තුමා විසිනි 2. අනගාරික ධර්මපාලතුමා විසිනි
3. වැලිවිට සරණංකර හිමි විසිනි 4. ගුරුළුගෝමී පඬිතුමා විසිනි

08. බුදුරජාණන් වහන්සේගේ ජීවිතය පියුමක් හා සමාන කර ඇත්තේ,
1. පියුමක් මෙන් උන්වහන්සේ සමාජය හා නොබැඳී නොඇලී වෙසෙන නිසාය.
2. පියුම ඇත්තේ මඩ සහිත දියේ නිසාය.
3. පියුම පවිත්‍රව ඇති නිසාය.
4. පියුම විවිධ වර්ගයන්ගෙන් යුක්ත නිසාය.

09. අන් අයගේ සතුට දැක තමන්ට වූ දෙයක් සේ සලකා සතුටු වීම,
1. මෛත්‍රී නම් වේ 2. මුදිතා නම් වේ
3. කරුණා නම් වේ 4. උපේක්ඛා නම් වේ

10. ශිෂ්‍ය ජීවිතය අර්ථවත් කරගැනීම සඳහා වැඩිහිටි අවවාද හා උපදෙස් පිළිගැනීමේ අගය පැහැදිලි කරනු ලබන ශ්‍රාවක චරිතය වන්නේ,

1. සැරියුත් තෙරුන්ගේ කථාවයි
2. මුගලන් තෙරුන්ගේ කථාවයි
3. රාහුල තෙරුන්ගේ කථාවයි
4. ආනන්ද තෙරුන්ගේ කථාවයි

11. තමා විසින් සිදුකරන ලද සියලුම කුසලයන් පිං පොතක ලියා තැබූ බෞද්ධ රජතුමා වන්නේ,

1. දුටුගැමුණු රජතුමාය
2. සද්ධාතිස්ස රජතුමාය
3. දේවානම්පියතිස්ස රජතුමාය
4. වළගම්බා රජතුමාය

12. බොදු දරුවන් වශයෙන් ගැටලුවක් ඇති වූ විට කළ යුත්තේ,

1. ගැටලුව විසඳෙන තෙක් බලා සිටීමය
2. ගැටලුව අමතක කිරීමය
3. විවිධ පුද පූජාවන් පැවැත්වීමය
4. ගැටලුවට හේතුව-සොයා පිළියම් යෙදීමය

13. ධර්ම විනිශ්චය, පොහොය දිනය වැනි බෞද්ධ ග්‍රන්ථ ලියූ මහා නාහිමිපාණන් වහන්සේ වනුයේ,

1. තොටගමුවේ රාහුල හිමිය
2. වැලිවිට සරණංකර හිමිය
3. රේරුකානේ චන්දවිමල හිමිය
4. මයුරපාද පිරිවෙන්පති බුද්ධ පුත්‍ර හිමිය

14. කපුටකුට හොටය දමාගැනීමට හැකිවන තරමට උගුරටම පිරෙන තුරු ආහාර ගන්නා තැනැත්තා හඳුන්වන්නේ,

1. කාකමාසක ලෙසය
2. අලංසාටක ලෙසය
3. භුත්තවමිතක ලෙසය
4. තත්ථාවට්ටක ලෙසය

15. නිශ්චිත අවස්ථාවෙහි විපාක දීමට ඉඩ නොලැබීමෙන් විපාක රහිත බවට පත්වන කර්මය වන්නේ,

1. දිට්ඨධම්මවේදනීය කර්මයයි
2. අපරාපරිය වේදනීය කර්මයයි
3. අහෝසි කර්මයයි
4. ආචිණ්ණ කර්මයයි

16. වසර දොළහක් මුළුල්ලේ පැවති බැමිණිතියා සාගතය ඇතිවූයේ,

1. දුටුගැමුණු රජු දවසය
2. වළගම්බා රජු දවසය
3. මහසෙන් රජු දවසය
4. පරාක්‍රමබාහු රජු දවසය

17. ලක්දිව බුදුදහම ස්ථාපිත වීමත් සමඟ ගොඩනැගුණ මුල්ම ස්තූපය වන්නේ,

1. මහියංගන චෛත්‍යයයි
2. රුවන්වැලිමහාසෑයයි
3. මිරිසවැටියයි
4. ථූපාරාමයයි

18. පුද්ගල සන්තානයේ කෙලෙස් මුළුමනින්ම නැතිකොට උපදවා ගන්නා ඥානය බුදුදහමේ හැඳින්වෙන්නේ,

1. පුබ්බේනිවාසානුස්සති ඥානය නමිනි
2. ආසවක්ඛය ඥානය නමිනි
3. චුතුපපාත ඥානය නමිනි
4. දිබ්බසෝත ඥානය නමිනි

19. යමක් කිරීමෙන් පසුතැවෙන්නට සිදුවේද යමක විපාක කඳුලින් පිරි මුහුණින් යුතුව අඬමින් විඳින්නට සිදුවේද එබඳු දේ නොකිරීම යහපත්ය, යන තේරුම අයත් ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ,

1. නතං කම්මං කතං සාධු
2. අත්තනාව කතං පාපං
3. අක්කොච්ඡි මං අවධි මං
4. සුකරානි අසාධූනි

20. පුද්ගලයකුගේ දියුණුවට අදාළ කරුණු 38 ක් දේශිත බෞද්ධ සූත්‍රය වන්නේ,

1. සිගාලෝවාද සූත්‍රයයි
2. කරණීයමෙත්ත සූත්‍රයයි
3. මංගල සූත්‍රයයි
4. රතන සූත්‍රයයි

21. ඇලීම් හා ගැටීම් යන දෙක අහිතකර බව වටහාගෙන අන්තගාමීත්වයෙන් තොර ව මධ්‍යස්ථ ව ක්‍රියා කිරීම බුදුදහමේ හැඳින්වෙන්නේ,

1. සමජීවිකතාව ලෙසය
2. උපේක්ෂාව ලෙසය
3. මෛත්‍රිය ලෙසය
4. මුදිතාව ලෙසය

22. "සත්හට වන බව දුකට වෙදාණන්" යන කවිය අඩංගු බෞද්ධ ග්‍රන්ථය වන්නේ,

1. ලෝවැඩ සඟරාව
2. සිරිත්මල්දම
3. සුභාෂිතය
4. කව්සිළුමිණ

23. බුදු දහමට අනුව මනුෂ්‍යයා නිර්මාණය වී ඇත්තේ ස්කන්ධ පහක එකතුවෙනි. එය පංචස්කන්ධය යැයි හැඳින්වේ. එනම්,
1. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය යන පහයි
2. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පහයි
3. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස යන පහයි
4. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පහයි.

24. කර්මය හා විපාක පෙන්වා දෙන බෞද්ධ සූත්‍රයක් වන්නේ,
1. චූල්ලකම්ම විභංග සූත්‍රයයි
2. පරාභව සූත්‍රයයි
3. ආදිත්ත පරියාය සූත්‍රයයි
4. මහා මංගල සූත්‍රයයි

25. දර - ගිනි යන භෞතික වස්තූන් අතර ඇති හේතුඵල සම්බන්ධය බුදුරජාණන් වහන්සේ දේශනා කළේ,
1. අග්ගික්ඛන්ධෝපම සූත්‍රයෙනි
2. අග්ගිවච්ඡගොත්ත සූත්‍රයෙනි
3. චක්කවත්ති සීහනාද සූත්‍රයෙනි
4. සෝණදණ්ඩ සූත්‍රයෙනි

26. බුදුරජාණන් වහන්සේට සිදුකරන ලද පූජාවන් රැසක් පිළිබඳව සඳහන් වන පූජාවලිය ලියූ කර්තෘවරයා වූයේ,
1. තොටගමුවේ රාහුල හිමිය
2. මයුරපාද පිරිවෙන්පති බුද්ධ පුත්‍ර හිමිය
3. ධර්මසේන හිමිය
4. විද්‍යා චක්‍රවර්ති පඬිවරයාය

27. විහාර මන්දිරයක හෝ රාජකීය ගොඩනැගිල්ලක දොරටුව අලංකාර කරමින් පියගැටපෙළ දෙපැත්තේ ඇති අර්ධ කවාකාර මුදුන සහිත කුඩා ගල් පුවරු දෙක හැඳින්වෙන්නේ,
1. කොරවක්ගල් ලෙසය
2. සඳකඩපහණ ලෙසය
3. මුරගල් ලෙසය
4. බෝධිසර ලෙසය

28. භාරතයේ පැවති සිව්වෙනි ධර්ම සංගායනාවට (සර්වාස්තිවාදී සංගායනාව) රාජ අනුග්‍රහය ලබාදුන්නේ,
1. කණිෂ්ක රජතුමාය
2. ධර්මාශෝක රජතුමාය
3. බින්දුසාර රජතුමාය
4. අජාසත්ත රජතුමාය

29. පමණ දැන ආහාර ගැනීමේ ඇති වැදගත්කම බුදුරජාණන් වහන්සේ පැහැදිලි කළේ,
1. බිම්බිසාර රජතුමාටය
2. කොසොල් රජතුමාටය
3. අජාසත්ත රජතුමාටය
4. උදේනි රජතුමාටය

30. ස්වාභාවික පරිසරයේ දිවි ගෙවමින් ලෝක සත්ත්වයාට බොහෝ ආදර්ශ සැපයූ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවේ,
1. උපවර්තන සල් උයනේදීය
2. ලුම්බිණි සල් උයනේදීය
3. පාරිලෙය්‍ය වනයේදීය
4. චාලිය පර්වතෙහිදීය

31. අධ්‍යාපන චාරිකාවේ නියැලුණු ශිෂ්‍ය පිරිස මිහින්තලේ කණ්ඨක චෛත්‍යය නැරඹීමට ගියහ. එක් ශිෂ්‍යයෙක් තම ගුරුතුමාගෙන් විමසුවේ මෙහි ඇති කලාත්මක අතින් උසස් නිර්මාණය කුමක්ද ? කියාය. ඊට උචිත පිළිතුර වන්නේ,
1. බෝධි සරය යන්නයි
2. වටදාගෙය යන්නයි
3. වාහල්කඩ යන්නයි
4. පියගැටපෙළ යන්නයි

32. උතුම් බලාපොරොත්තුවක් ඉටුවන තුරු නොපසුබට උත්සාහයෙන් කටයුතු කිරීම වීර්යයයි. යම් කාර්යයක නිරත වීමේදී ඇති කර ගත යුතු වීර්යය බුදුදහමේ හැඳින්වෙන්නේ,
1. ආරම්භ ධාතු ලෙසය
2. පරක්කම ධාතු ලෙසය
3. නික්කම ධාතු ලෙසය
4. විරිය ධාතු ලෙසය

33. සම්මා සම්බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝධිසත්වයන් වහන්සේලා විසින් පාරමී, උප පාරමී, පරමාර්ථ පාරමී යන තුන් ආකාරයෙන් දස පාරමිතා වැඩිය යුතුය. පසේ බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝධිසත්වයන් වහන්සේලා පිරිය යුතු පිළිවෙත් වන්නේ,
1. උප පාරමී අවස්ථාව පමණි
2. පාරමී, උප පාරමී අවස්ථා දෙක පමණි
3. පරමත්ථ පාරමී අවස්ථාව පමණි
4. උප පාරමී, පරමත්ථ පාරමී අවස්ථා දෙක පමණි

34. බෞද්ධයාගේ අත්පොත වන ධම්මපදයේ අයත් ගාථා ගණන,

1. 423 කි    2. 460 කි    3. 422 කි    4. 421 කි

35. බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාද ධර්මය තුළින් හෙළිකළ ප්‍රධාන ම කරුණ වූයේ,

1. දුක ඇති වන සැටි පෙන්වාදීමයි
2. දුක නැති වන සැටි පෙන්වා දීමයි
3. උපත හා මරණය අතර සම්බන්ධය පෙන්වා දීමයි
4. දුක ඇති වන සැටි හා දුක නැති වන සැටි පෙන්වා දීමයි

36. බුද්ධ කාලයට පෙර සමථ භාවනාව ප්‍රගුණ කළ ධ්‍යාන හා අභිඥාලාභියකු වූයේ,

1. අසිත තවුසාය
2. උපතිස්ස බමුණාය
3. සර්වමිත්‍ර බමුණාය
4. සෝණදණ්ඩ බමුණාය

37. සිගාලෝවාද සූත්‍රයට අනුව ශිෂ්‍යයන්ගේ ගරු සැලකිලි ලැබීමට සුදුසු වන බැවින් ගුරුවරු,

1. උතුරු දිසාව නමින් හැඳින්වෙති
2. දක්ඛිණ දිසාව නමින් හැඳින්වෙති
3. නැගෙනහිර දිසාව නමින් හැඳින්වෙති
4. යට දිසාව නමින් හැඳින්වෙති

38. සිංහල දෙමළ අලුත් අවුරුදු උත්සවයේදී බෞද්ධයන් පුණ්‍ය කාලය ගත කරන්නේ,

1. ආගමික කටයුතුවල නිරත වීමෙනි
2. නෑගම් යෑමෙනි
3. වැඩිහිටියන්ට උදව් කිරීමෙනි
4. රැකී රක්ෂාවලට යෑමෙනි

39. බුදුරජාණන් වහන්සේ රෝග වැළඳීමට හේතු වන කරුණු අටක් පෙන්වා දුන්නේ,

1. මහා කාශ්‍යප රහතන් වහන්සේටය
2. සැරියුත් රහතන් වහන්සේටය
3. රාහුල හිමියන්ටය
4. ආනන්ද හිමියන්ටය

40. පරිසරය මූලික වශයෙන් ජීවී අජීවී වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. එයින් අජීවී පරිසරය යනු,

1. අප අවට ඇති විවිධ ශක්තීන්ය
2. අප අවට ඇති ගස් කොළන්ය
3. අප අවට ඇති පණ නැති සියලු දේ ය
4. අප අවට ඇති ගිරිශිඛරය

සියලු ම හිමිකම් ඇවිරිණි |
முழுப் பதிப்புரிமையுடையது |
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணைமதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | බුද්ධ ධර්මය II පත්‍රය<br>புத்த சமயம் வினாத்தாள்-I<br>Buddhism I Paper | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hour |

සැලකිය යුතුයි:

පළමු වන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. පළමු වන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගත් එක් ප්‍රශ්නයකට ලකුණු දහයක් බැගින්ද හිමිවේ.

(01) කෙටි පිළිතුරු සපයන්න.

1. බුදුරජාණන් වහන්සේගේ පුරිසදම්මසාරථී ගුණය ප්‍රකට කරන අවස්ථා දෙකක් ලියන්න.
2. නිවන් මග හෙළිකර ගැනීමේ ප්‍රථම පියවර කුමක්ද ?
3. අනුන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීම බුදුදහමට අනුව හඳුන්වන්නේ කිනම් නමකින්ද ?
4. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" මේ පාඨයේ අදහස ලියන්න.
5. නිර්වාණාවබෝධය සඳහා අන්තගාමී නොවී මැදුම් පිළිවෙතක් අනුගමනය කළ යුතුය. මේ අනුව අත්හළ යුතු අන්ත දෙක කවරේද ?
6. කාශගත් ප්‍රසාදය දිනා සිටි ගාමිණී හැම විට ම තම මිතුරන්ට කල්‍යාණ මිත්‍රයෙක් ම විය. සිගාලෝවාද සූත්‍රය අනුව ඔහුගෙන් මිතුරන්ට ඉටුවන්නේ යයි සිතන යුතුකම් දෙකක් ලියන්න.
7. සතර අගතියෙන් වෙන්වූ පාලන ක්‍රමයක් තිබීම රටේ ජනතාවගේ යහපතට හේතුවේ. එම සතර අගතියෙන් දෙකක් නම් කරන්න.
8. බෞද්ධ සිද්ධස්ථානයකට පිවිසෙන පියගැටපෙළක ආරම්භයේ දක්නට ලැබෙන අර්ධ කවාකාර ගල් පුවරුව හැඳින්වෙන්නේ කිනම් නමකින්ද ?
9. බුදුරජාණන් වහන්සේ පළමු වන හා පස්වන වස්කාලය ගත කළේ කිනම් ස්ථානයන්හිද ?
10. අති පූජ්‍ය රේරුකානේ චන්ද්‍රවිමල මහනාහිමිපාණන් වහන්සේගේ ජීවිතයෙන් ලබාගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.

(02) මෙලොව උපන් මිනිසාට උපතේ සිට සිය මරණය තෙක් විවිධාකාර අභියෝග රැසකට මුහුණදීමට සිදුවේ. අභියෝගවලට මුහුණ දුන් පරමාදර්ශී චරිතය වන්නේ බුදුරජාණන් වහන්සේය.

1. බුදු සිරිතෙහි දක්නට ලැබෙන අභියෝග දෙකක් ලියන්න.
2. බුදුරජාණන් වහන්සේ අභියෝගවලින් එකක් ජයගත් අවස්ථාවක් කෙටියෙන් ලියන්න.
3. ඉගෙනුමෙහි නිරත ශිෂ්‍යයන් වන අපට මුහුණදීමට සිදුවන අභියෝග රැසකි. එම අභියෝගවලට සාර්ථකව මුහුණදීමට බුදු සිරිතෙන් ලබාගත හැකි ආදර්ශ කවරේද ?

(03)1. බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝසත් උතුමන් විසින් පුරන ලද බුද්ධ කාරක ධර්ම දෙකක් ලියන්න.

2. බුද්ධ කාරක ධර්ම පුහුණු කරන්නකු සම්පූර්ණ කළ යුතු ගුණධර්ම පහෙන් තුනක් නම් කරන්න.
3. සදාචාර සම්පන්න සමාජයක් ඇති කිරීම සඳහා බුද්ධ කාරක ධර්ම කොතෙක් දුරට උපකාරී වේදැයි විමසන්න.

(04) පුද්ගලයන්ගේ මෙලොව දියුණුව හා පරලොව දියුණුව පිළිබඳව ඉතා සරලව ඉදිරිපත් කළ ධර්ම කරුණු රාශියක් ත්‍රිපිටක ධර්ම දේශනා තුළ අපට හමුවෙයි.

1. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි දී පුද්ගලයකුගේ මෙලොව දියුණුව පිණිස දේශනා කළ කරුණු සතරෙන් දෙකක් ලියන්න.
2. ඉන් එකක් විස්තර කරන්න.
3. මංගල සූත්‍රයට අනුව ශිෂ්‍යයන් වශයෙන් තම ජීවිතය සාර්ථක කරගැනීම සඳහා විනය ගරුකභාවය, නුවණැත්තන් ඇසුරු කිරීම, ඉවසීම වැනි ගුණ ධර්ම කොතෙක් දුරට උපකාරී වේදැයි පැහැදිලි කරන්න.

185

(05) 1. තණ්හාව මුල්කොට ගෙන සමාජයේ කලකෝලාහල ඇති වන අයුරු පටිච්ච සමුප්පාද න්‍යාය අනුව පෙන්වා දෙන බෞද්ධ සූත්‍රයේ නම කුමක්ද ?

2. "අවිජ්ජා පච්චයා සංඛාරා" යන්නෙහි අර්ථය කෙටියෙන් ලියන්න.

3. පටිච්ච සමුප්පාද න්‍යාය තේරුම් ගැනීමෙන් පුද්ගල හා සමාජ ගැටලු විසඳා ගත හැකි අයුරු ධර්මානුකූලව පහදන්න.

(06) අනුරාධපුර යුගයේ සිට දඹදෙණි යුගය දක්වා රචනා වූ ගද්‍ය පද්‍ය සාහිත්‍ය කෘති රාශියක් අපට උරුම වී ඇත.

1. බුද්ධ චරිතය පාදක කොටගෙන පොළොන්නරු යුගයේ ලියැවුණු ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

2. පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, කව් සිළුමිණ යන ග්‍රන්ථ රචනා කළ කර්තෘවරුන් කවුරුන්ද ?

3. "මහින්දාගමනය නිසා අපට ලැබුණු දායාද අතර, සාහිත්‍යයට ලැබෙන්නේ වැදගත් තැනකි." ලංකාවේ පැරණි සිංහල සාහිත්‍ය කෘති නිදසුන් ලෙස දක්වමින් මෙම කියමන සනාථ කරන්න.

(07) **ස්වාමීනි, මේ ගමට එන සමහර මහණ බමුණෝ අනුන්ගේ ඉගැන්වීම්වලට පරිභව කරමින් තම ඉගැන්වීම් උසස් කොට දක්වති. ස්වාමීනි, මෙම මහණ බමුණන් අතුරෙන් කවරෙක් සත්‍ය කියත්ද කවරෙක් අසත්‍ය කියත්ද'යි අපට සැකයක් විමතියක් ඇතිව තිබේ.**

1. බුදුන්වහන්සේට ඉහත ආකාරයෙන් කරුණු ඉදිරිපත් කරනු ලැබුවේ කවුරුන් විසින්ද ?

2. කළ යුත්ත නොකළ යුත්ත තීරණය කිරීමේදී පදනම් කර නොගත යුතු යැයි දේශිත කරුණු දහයෙන් තුනක් නම් කරන්න.

3. ගතානුගතිකත්වයෙන් තොර ව සාධාරණ ව නිදහස් ව සිතා විමසා බැලීමෙන් ශිෂ්‍ය ජීවිතයට සිදුවන යහපත කවරේද ?

(08)

1. "උට්ඨානවතෝ සතිමතෝ" ගාථාව සම්පූර්ණ කරන්න.

2. දියුණු වන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංග හතෙන් තුනක් ලියන්න.

3. අර්ථ රසයෙන් ශබ්ද රසයෙන් යුත් ධම්මපදයෙන් අපේ ජීවිතය සාර්ථක කරගැනීමට ලැබෙන පිටුවහල ගාථා දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න.

The National e-learning Portal for The General Education